## <u>මාලිම්බඩ ප්‍රාදේශීය සභාව</u>
## <u>2026 වර්ෂය සඳහා රියදුරන් ලියාපදිංචි කිරීම</u>.

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සේවා අවශ්‍යතාවය සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවයේ යොදවා ගැනීමට රියදුරු තනතුර සඳහා **2026.10.06** දින සිට **2026.10.20** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>අධ්‍යාපන සුදුසුකම්.</u>**

- දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා.පෙළ) විභාගයේ ඕනෑම විෂයන් 06 ක් සමත් වීම.

**<u>ශිල්පීය නිපුණතා.</u>**

- බර වාහන පැදවීමට අදාලව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බල පත්‍රයක් හා නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.
- මෝටර් රථ රියදුරු පත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**<u>වෙනත් සුදුසුකම්.</u>**

- ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට දකුණු පළාතේ මාලිම්බඩ සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.පදිංචිය ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකයක් මඟින් සනාථ කර යුතුය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවු.18 ට නොඅඩු හා අවු.45 ට නොවැඩි විය යුතුය.

**<u>බඳවා ගැනීමේ ක්‍රමය.</u>**

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵලය මත බඳවා ගනු ලැබේ.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව PL 3 තනතුරට අදාලව දෛනික වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගැනීම.

**<u>අයදුම්පත් එවිය යුතු ආකාරය.</u>**

- මේ සමඟ අමුණා ඇති අයදුම්පත අනුව ඔබ විසින් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ගත් අයදුම්පත **<u>2026.10.20</u>** දිනට ප්‍රථම ලිපි කවරයේ වම් පස ඉහළින් **<u>"රියදුරු තනතුර සඳහා අයදුම් කිරීම"</u>** යනුවෙන් සඳහන් කර **<u>"සභාපති" , මාලිම්බඩ ප්‍රාදේශීය සභාව ,මාලිම්බඩ, පාලටුව යන ලිපිනයට</u>** ලියාපදිංචි තැපෑල මඟින් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

අයදුම්පත සමඟ පහත සඳහන් සහතික වල පිටපත් ඇමිනිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

01.උප්පැන්න සහතිකය
02.අධ්‍යාපන සහතික
03.පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකය
04.මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්
05.පළපුරුද්ද පිළිබඳ සහතිකය